ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

ලංසු ආරාධනය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙත මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ප්‍රසම්පාදනය
IFBඅංකය:DIE/PRO/02/2026/80

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් **මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ පහත සඳහන් වාහන ප්‍රසම්පාදනය** සඳහා යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

වාහන වර්ගය	ප්‍රමාණය	කාලසීමාව
ඩබල් කැබ් රථ	02	මාස 24
මගී වෑන් රථ (ආසන 15)	02	මාස 24

2. මෙම ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය යටතේ පැවැත්වේ.

3. රුපියල් හාර දහසක (රු.4,000/-) ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ, "සුභුරුපාය", 05 වන මහලේ,බී පර්යන්තයේ, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, ප්‍රසම්පාදන අංශයේ, නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන)වෙත ඉදිරිපත් කිරීමෙන් මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් **2026.10.20 දින සිට2026.11.04 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාල පරිච්ඡේදය** තුළදී මිල දී ගත හැක. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර **සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00දක්වා** කාල පරිච්ඡේදය තුළ දී 0112 – 101559 දරන දුරකතන අංකය අමතා ලබා ගත හැක. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන www.immigration.gov.lk හරහා **2026.10.20 දින සිට2026.11.04 දින දක්වා** නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂාව සිදු කළ හැක.

5. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු,"මුල් පිටපත"(Original) හා "අනුපිටපත" (Duplicate) ලෙස වෙන වෙනමම කවරවල බහා එම කවරඑකම කවරයක බහා මුද්‍රා තබා මෙම මුද්‍රා තැබූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්කරුගේ නම සහ IFB අංකය සඳහන් කර පහත සඳහන් කර ඇති ලිපිනයට **2026.11.04 වැනි දින ප.ව. 2.00**ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් ඒ සඳහා3 වැනි ඡේදයේ සඳහන් ලිපිනයේ තබා ඇතිටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදු කළ යුතුය. ලංසුව, ලංසු භාරගන්නා අවසාන දින සිට **දින අනූ එකක්** (91) දක්වා හෝ ගැනුම්කරු විසින් නියම කරනු ලබන ඕනෑම දිගුකරන කාල පරිච්ඡේදයක් සඳහා වලංගුභාවයෙන් යුක්ත විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම, පැමිණීම සඳහා කැමැත්ත දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
05 වැනි මහල,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
"සුභුරුපාය"
ශ්‍රී සුභූතිපුර පාර,බත්තරමුල්ල.

6. පූර්ව ලංසු රැස්වීමක්**2026.10.27** වෙනි දින පැය 14.00 ට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 05 වෙනි මහල, "සුභුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල යන ස්ථානයේදී පැවැත්වෙනු ඇත.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
05 වැනි මහල,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
"සුභුරුපාය"
ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.